**ක්‍රිස්තියානි ධර්මය - 11 ශ්‍රේණිය**
**දෙවන වාර පරීක්ෂණය - 2024**

# පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01). | ii | 11). | ii | 21). | iii | 31). | iv |
| 02). | ii | 12). | ii | 22). | iv | 32). | iv |
| 03). | iv | 13). | iv | 23). | iii | 330. | ii |
| 04). | iii | 14). | iii | 24). | i | 34). | iv |
| 05). | iv | 15). | i | 25). | iii | 35). | ii |
| 06). | ii | 16). | iv | 26). | iii | 36). | ii |
| 07). | i | 17). | iii | 27). | i | 37). | iii |
| 08). | ii | 18). | i | 28). | ii | 38). | ii |
| 09). | iv | 19). | iii | 29). | iii | 39). | iv |
| 10). | ii | 20). | ii | 30). | iv | 40). | iii |

## II කොටස

01. i) එම්මානුවෙල්
ii) ගින්න
iii) සිනගෝග හෙවත් ධර්මශාලා
iv) ඩුනෝමිස්
v) එම්මාවුස් ගමන ගිය ශ්‍රාවකයන් දෙදෙනා
vi) ජේසුස් වහන්සේ විසින් ජොහාන් ගැනය
vii) ශාලොම්
viii) පෙන්තකොස්ත දින
ix) සාවුල් හෙවත් පාවුල්
x) නිකදෙමුස්

02. i) කාන්තාවන් / දිළින්දන් / දරුවන් / බඳු එකතු කරන්නන්
ii) කාන්තාවන් -
- ජේසුස් වහන්සේ කාන්තාවන් ප්‍රතික්ෂේප නොකර ඔවුන් සමග කටයුතු කිරීම.
- ජේසුස් වහන්සේට කාන්තා අනුගාමිකයන් සිටීම.
- පව්කර ස්ත්‍රියට සමාවදීම.
- සමාරිය ස්ත්‍රිය යහමගට ගැනීම.
- පාද සේදූ ස්ත්‍රියගේ ක්‍රියාව අගය කිරීම.

දරුවන් -
- ජේසුස් වහන්සේ දරුවන් වඩාගෙන ඔවුන්ට ආශිර්වාද කිරීම.
- කුඩා දරුවෙකු සේ නොවුනහොත් දේව රාජ්‍යයට ඇතුල් නොවන බව ගෝලයන්ට පැවසීම.
- කුඩා දරුවන්ට පිඩා කරන අයෙකු වෙද ඇඹරුම්ගලක් ගෙල වටා බැඳ මුහුදට තල්ලු කිරීම ඔහුට යහපත් බව.

අයකැමියන් -

◆ අයකැමියන් සමඟ ආහාර ගැනීම.

◆ අයකැමියෙකු තම ගෝල පිරිසට එකතු කර ගැනීම.

◆ සාකෙවුස්ගේ නිවසට යාම.

iii) දිළින්දන් / යාචකයන් / මත්ද්‍රව්‍යට ඇබ්බැහිවූවන්

◆ දිළින්දට ජීවත්වීමට උදව් උපකාර කිරීම.

◆ ඔවුන්ගේ ජීවනෝපාය සකස් කර ගැනිමට රැකියාවක් සපයාදීම.

◆ අපට තිබෙන දේ අන් අය හා බෙදා ගැනීම.

◆ මත්ද්‍රව්‍යන්ට ඇබ්බැහිවූවන් ඉන් මුදවා යහ මගට ගැනීම.

◆ ඔවුන් උදෙසා යාච්ඤා කිරීම.

සිසුන්ගේ පිළිතුරු බලා සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.

03. i) සද්දුසිවරු, පරිසිවරු

ii) ◆ ජාතිය කැරළි ගැසීමට පෙළඹවීම.

◆ අධිරාජ්‍යයාට බදු ගෙවීම තහනම් කිරීම.

◆ තමා ක්‍රිස්තුස් නම් රජෙකු බව ප්‍රකාශ කිරීම.

iii) ◆ කාන්තා ගෝලයින් පැමිණ දැනගත් සුපුවත ගැන ප්‍රිතිවීම හා අත්දැකීම් අන් අය සමග බෙදා ගත්තාසේ අපද සුපුවත අන් අය හා බෙදා ගැනීම.

◆ බලාපොරොත්තු විරහිතව සිටි ශ්‍රාවකයන්ට ජේසුස් වහන්සේ දුටු පසු උද්යෝගීමත් වුවාසේ අපද උද්යෝගීමත් ජීවතවලට නැඹුරුවීම.

◆ කිතුනු අප ජේසුස් වහන්සේ ජීවමාන බව අත්දැකීම.

◆ නොදැක විශ්වාස කරන අප වඩා ආශිර්වාද ලත් වාසනාවන්තයින් බව.

◆ විමුක්තිය හා සදාතනික ජීවිතය ලබන බවට ඇති බලාපොරොත්තුවෙන් සැමට මෙහෙ කිරීම.

04. i) ◆ මිනිසා හා දෙවියන් වහන්සේ අතර සබඳතාව හා මිනිසා දෙවියන් වහන්සේ සම්බන්ධයෙන් කළ යුතු පරම යුතුකම් හා වගකීම්.

උදා : සබත් දවස ශුද්ධ ලෙස පැවැත්වීමට සිතට ගන්න. 1, 2, 3. 4 පනත්

◆ මිනිසා හා මිනිසා අතර පැවතිය යුතු ගුණධර්ම

උදා : අසල්වැසියා සතු කිසිවිටෙකවත් ඇලුම් නොකරන්න. 5, 6, 7, 8, 9, 10 පනත්

ii) පූජකවරු / රජවරු / දිවැසිවරු

iii) ◆ බැටළුවන්ට අවශ්‍ය ආහාර හා ජලය සපයයි.

සුනිල් තෘණ බිම් මත සතප්පා .... ගීතාවලිය 23 - 2

හොඳ තෘණ වලින් පෝෂණය කරයි. එසකියල් 34 : 14

◆ මග පෙන්වීම, රැක බලා ගැනීම හා සොයාගෙන ඒම

'' මම නැති වූ බැටළුවා සොයන්නෙමි, මුලාව ගිය බැටළුවා ආපසු ගෙනෙන්නෙමි. එසකියෙල්

දණ්ඩෙන් හා සැරයටියෙන් මග පෙන්විම - ගීතාවලිය

ආරක්ෂා කිරීම හා ජීවිතය කැප කිරීම.

◆ දිව්‍ය එඬේරාණෝ සිය බැටළුවන් සමග සිට ඔවුන් ආරක්ෂා කරයි. මරණය වැනි ගණඳුරා රුදුරු නිම්නය මැදින් ගියත් ඔබ මා සමග බැවින් මට කිසි බියක් නොවන්නේ ය - ගීතාවලිය.

◆ සතුරන් ඉදිරියේ මංගල බොජුනක් පිළියෙල කර දී බැටළුවන් හට දේව ආරක්ෂාව ලැබෙන නිසා නිදහසේ බිය සැක නැතිව කල් ගෙවිය හැකිය.

05. i) ◆ තමාගේ මුළු ජීවිතයම දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම.

◆ තමාට මෙන්ම තම අසල්වැසියාට ප්‍රේම කිරීම.

ii) කමා නොවූ දාසයා පිළිබඳ උපමා කතාව.

◆ විශාල ණය බරකින් සිටි දාසයෙක් තම ණය ප්‍රමාණය ගැන ඉවසමින් තමාට සමාවව දෙන්න යැයි තම ස්වාමියාගෙන් ඉල්ලීම.

◆ ස්වාමියා දාසයාට අනුකම්පා කර ඔහු ණය බරින් නිදහස් කිරීම.

◆ සමාව ලැබූ දාසය ඉන්පසු තමාට ණය වූ පුද්ගලයෙකු හමු වූ පසු එය නොගෙවූ බැවින් ඔහුව හිර අඩස්සියට පැමිණවීම.

◆ එය ඇසූ ස්වාමියා තම දාසයා පිළිබද කෝප වී ඔහුට දඬුවම් කිරීම.

iii) ◆ විවිධ ජාති ආගම් වලට බෙදා සිටිය ද අප ක්‍රිස්තුස් වහන්සේට අයත් දරුවන් බව තේරුම් ගෙන සහයෝගයෙන් විසීම.

◆ විවිධත්වය ප්‍රයෝජනයට ගෙන පාසල තුළ සංහිඳියාවෙන් හා එකත්වයෙන් විසීම.

06. i) නමස්කාර ජීවිතය / ධර්මදූත සේවය / ධර්මදාන මෙහෙවර / සුභ සාධක මෙහෙවර

ii) ◆ ජේසුස් වහන්සේගේ කැඳවීමට ක්ෂණිකව ප්‍රතිචාර දැක්වූ ශ්‍රාවකයෙකි.

◆ ජේසුස් වහන්සේ ක්‍රිස්තුවරයාණෝ බව ප්‍රකාශ කළ ප්‍රථම ශ්‍රාවකයා ය.

◆ ජේසුස් වහන්සේ නාඳුනන බව තෙවරක් ප්‍රකාශ කළ ශ්‍රාවකයා ය.

◆ ජේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහණයෙන් පසුව මුල් සභාවේ මූලිකත්වය ගෙන කටයුතු කළේ ය.

iii) ◆ බහු ආගමික සමාජයක වෙසෙන ලාංකික කිතුනු අප ස්ථානෝචිතව ක්‍රියා කළ යුතු ය.

◆ තමා දන්නා භාෂාවන් හා සිරිත් විරිත් හෙළා නොදැක ඒ තුළින් දහම් ප්‍රචාරයට පිවිසීම.

◆ ජීවමාන දෙවියන් වහන්සේ අපතුළ වැඩ වසන බව ප්‍රකාශ කළ යුතුය.

◆ සියල්ලට වඩා වැදගත් වන්නේ ස්ථිර ඇදහිල්ල බව.

◆ විවිධ බහු මතවාද හමුවේ අදාළ ලෙස දේව පණිවිඩය යොදා ගැනීම.

07. i) ◆ පාවුල් තුමාගේ ධර්මදූත සේවය.

සහභාගී වූවන් - පාවුලු, බාර්ණබස්, ජොහාන් මාක්

◆ සිරියේ අත්තියොකිය - සයිප්‍රසය - පාපජ් - පර්ගා - පිසිදියේ අත්තියොකිය - ඉකොනිය - ලුස්ත්‍රාව - දර්බය

◆ සිදු වූ සුවිශේෂි සිදුවීම.

◆ සිරියාවේ අත්තියොකියෙන් නැව් නැග සයිප්‍රස් දූපතට පැමිණ පාපස් හී සර්ගියස් පාවුලස් නැමති බුද්ධිමත් දේශාධිපතියා හමුවීම. පර්ගායේදී ජොහාන් මාර්ක් ගේ සමුගැනීම, අතිතියොකියෝ ධර්ම ශාලාවේ දේශනා කිරීම. බොහෝ දෙනෙකු දහා ගැනීම. ඊළඟ සබත් දිනවල ද දේශනා කිරීමට ආරාධනා ලැබීම. ඉකොනියෙ ධර්ම ශාලාවල දේශනා කිරීම. ජුදෙව්වන්ගෙන් බාධා එල්ලවීම. ලුස්ත්‍රාවේ දී උපන්දා සිට කොරව සිටි මිනිසෙකු සුව කිරීම නිසා ඔවුන් දෙව්වරුන් යැයි සිතා පුද පූජා කිරීමට සැරසීම. දර්බයේ සුභාරංචිය දේශනා කොට බොහෝ දෙනෙකු ශ්‍රාවකයන් කිරීමට හැකිවීම.

◆ ආපසු ගමන

◆ ආපසු ගමනේ දී හවුල් නායකත්වය තුළ පැවති උද්යෝගී ලක්ෂණ

දේව රාජ්‍ය උදෙසා දුක් විඳීමේ අවශ්‍යතාවය පැහැදිලි කිරීම.

ශ්‍රාවකයන් දිරිමත් කිරීම.

සභාවේ සැදැහැවතුන් කෙරෙහි සභා මූලිකයන් පත් කිරිම.

උපවාස කර යාච්ඤාවේ යෙදෙමින් සමිඳාණන් වහන්සේට සැදැහැවතුන් භාරදීම.

◆ අභියෝග මැද වුව ද දෙවියන් වහන්සේ අපට මඟ පෙන්වන ආකාරය, නායකත්වයෙන් ක්‍රියා කිරීම. සෑම විටම සාමූහික හැඟීමෙන් කටයුතු කිරීමෙන් අභියෝග ජය ගත හැකි බව.

ii) අපොස්තුළු පාවුල්තුමා

◆ සාවුල් හෙවත් පාවුලුගේ උපන් නගරය තාර්සස් බවත් එය ධනවත් මෙන්ම වාණිජ මධ්‍යස්ථානයක් බවත්, එම නගරයේ උපත ලැබීම හා හැදී වැඩීම ලැබූ අධ්‍යාපනය එතුමාගේ ජීවිතයට බලපෑ අන්දම පිළිබඳ කරුණු තිබිය යුතුය.

◆ ඔහු භක්තිමත් ජුදෙව්වෙකු බවත් ජුදෙව්වන් භාවිතා කළ හෙබ්‍රෙව් බස හොඳින් දැන සිටි බව ජුදෙව් සිරිත් විරිත් වලට දැඩි ඇල්මක් දැක්වූ බවත්,

◆ ඔහුගේ දෙමාපියන් පරිසිවරුන් බව, ජුදෙව් ආගමික නීතිය ජනයාට පිළිගැන්වූ අය පරිසිවරුන් බවත්, මේ නිසා පාවුල්තුමා ජුදෙව් ආගමික වත් පිළිවෙත් හා නීති රීති හැදෑරීමට යොමු වූ බවත්,

◆ පාවුල්තුමා උපතින්ම රෝම පුරවැසිභාවයට හිමිකම් ලද්දෙක් බවත්, පාවුල්තුමාට එය හිමි වූ අන්දම එය පසු කාලීනව සේවය සඳහා උපකාරී වූ අන්දම ආදී කරුණු ඇතුලත් විය යුතු ය.

◆ පාවුල්තුමා තදින් තම ආගම එනම් ජුදෙව් ආගම අදහන්නෙක් හා පිළිවෙත් රකින්නෙකු බැවින් ජුදා ආගමට වැඩි බලපෑමක් කිතුණු ආගම අදහන්නන් නිසා දැක්වූ බවත් දැන ඔවුන් මර්ධනය කිරීමට කටයුතු කිරීම.

ස්තේපන්ට ගල් ගසා මරණ අවස්ථාවේ දී එයට සතුටු වීම පසුව ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන්ට පීඩා කළ බවත් කිතුණුවන් අල්ලා ජෙරුසලමට ගෙන ඒම සඳහා දමස්කයට ගිය බව ආදී කාරණා ඇතුළත් විය යුතු ය.

iii) ◆ අන්වෙසක් වීමේ සිද්ධිය ලුහුඬින් ඉදිරිපත් කර තිබීම.

◆ ජේසුස් වහන්සේගේ දෙපස සිටි දෙදෙනා නම් කර තිබීම ව්‍යවස්ථාවත් අනාගත වාක්‍යත් ක්‍රිස්තුස් වහන්සේ තුළින් සම්පූර්ණ වූ බව.

◆ පේදුරුගේ ප්‍රතිචාරය.

''ස්වාමිනි අපි කූඩාරම් තුනක් සාදමු ...'' ශ්‍රාවකයන්ට අවශ්‍ය වූයේ මණ්ඩප තුනක් සාදා කඳු මුදුනේ සිටීමය.

◆ ගෝලයන්ට ඇසුනු හඬ '' මේ මාගේ පුත්‍රයාණෝ ය. මේ මා තෝරාගත් තැනැත්තාණෝ ය. මොහුට සවන් දෙන්න.''

◆ ජේසුස් වහන්සේගේ මෙලොව සේවය සම්පූර්ණවීමට ජෙරුසලමට යා යුතු බවත් මනුෂ්‍යයාගේ පාපය උදෙසා දිවි පුද කළ යුතු බව.

◆ අනාගතයේ දී සිදුවන්නට නියමිත ජීවිත පූජාව ස්ථිර කිරීම.

◆ මේ තුළින් ක්‍රිස්තුස් වහන්සේ තුළ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම.

iv) ◆ පිවිතුරු දිවියකට කැඳවීම දෙවියන් වහන්සෙගෙන්ම ලැබෙන බව.

◆ දිවැසිවර කාර්ය මිනිසුන් අතරට ගෙන යන පණිවිඩකරුවා වීම.

◆ ශුද්ධත්වය ලැබීම ශුද්ධත්වය ලැබෙන්නේ දෙවිඳුන්ගෙන්මය.

පාපය අපවිත්‍රකමින්, අපවිත්‍ර ජනතාවක් සමඟ සිටිය ද දෙවිදාණන්ගේ කැමැත්තට භාරවීම තුළ අප පවිත්‍ර කරනු ලබන බව - යෙසායා මෙන්.

◆ දේව කැඳවීම මඟනොහැර එය පිළිගැනීම, දාවිත් මෙන් නිර්මල සිතක් ඉල්ලා යැදීම.

◆ පිවිතුරු දිවියක් ලබන මිනිසා සමාජයට යහපත උදෙසා කටයුතු කරන බව.